## 172 – කුමක් කමුද කුමක් බොමුද

කුමක් කමුද කුමක් බොමුද අඳිමුදැයි කියා
ලතැවී ඉන්නෙ මන්ද සොයුර පියෙක් ඇත බලා

කුරුළු රංචු කැදලි කරා පියාසර කරයි
කෑම පතා අටුකොටුවල රැස් කර නොතබයි
මානෙල් මල් කෙතෙහි පැළඳී ළස්සන කදිමයි
සරසවන්න තුල් කැටුවෙ කවුරුද පුදුමයි

උසින් වියත කැමති ලෙසට ලබා ගත නොහේ
හිසේ වර්ණෙ සිතූ ලෙසට වෙනස් කළ නොහේ
සැකය ඇයිද දරුවකු වෙත අසහනය දැනී
ඔබට පියෙක් ඇත සගයේ ආදරෙන් පිරි

මෙලෝ සැපත මවන ධනය විනාසෙට ඇදෙයි
දෙවිඳු සතුට සොයා යන්න සියළු දෙය ලැබෙයි
නපුරු පියත් තම දරුවනට සුවසෙත සලසයි
කරුණාබර සගේ පියා ඔබම සොයා එයි